## Abstract 24

# වර්තමාන ජන ජීවිතය හා බැඳුණු අමනුෂ්‍ය චර්යා පිළිබඳ බෞද්ධ මූලාශ්‍රයාගත අධ්‍යයනයක්

**පූජ්‍ය. හසලක සීලවිමල හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ දර්ශනය),
*seelawimalah@gmail.com*

ජන ජීවිතයට හානිකර අයුරින් කටයුතු කරන **ප්‍රේත** හා **භූත** කොටස් ඇතුළු අමනුෂ්‍ය බලවේග පිළිබඳවත් ඉන් මිදීම පිණිස උපදේශ සපයන ශාස්ත්‍රයන් පිළිබඳ මනුෂ්‍ය වර්ගයාගේ ආරම්භයේ සිට ම අවධානය යොමු වී ඇත. අමනුෂ්‍ය බලවේග හුදෙක් මනෝමූලික රෝගයකැයි භෞතිකවාදීන් විසින් පිළිගනු ලබන නමුත් ඔවුන් විසිනුදු මෙතෙක් එම රෝග විෂයයෙහි ප්‍රමාණවත් ප්‍රතිකාර ක්‍රමයක් ඉදිරිපත් කොට නැත. බුදුන් වහන්සේ පියවි ඇසට නො පෙනෙන ජීවීන් පිළිබඳ වර්ගීකරණයන් දක්වා ඇති අතර එවැනි අමනුෂ්‍යයන් අතරින් විවිධ ප්‍රේත කොටස් හා යක්ෂයන් ද සිටින බවත් ඔවුන් මිනිසුන් විෂයයෙහි සිදුකරන හිරිහැර පිළිබඳව ද තොරතුරු අනාවරණය කර ඇත. නූතන විද්‍යාව මනෝවිකාරයන් සේ බැහැර කරන මෙම තත්ත්වය එසේ බැහැර නො කළ යුතු අතර බුදුසමය එවැනි අමනුෂ්‍ය උවදුරු වැඩිවීම සඳහා හේතු වන අධර්මය, රාගය, විෂම ලෝභය වැනි හේතූන් ගණනාවක් පෙන්වා දී තිබේ. **දීඝනිකායේ ආටානාටිය සූත්‍රයට** අනුව බුදුන් වහන්සේට පවා ප්‍රිය නො කරන අමනුෂ්‍යයන් පිළිබඳ තොරතුරු දක්වේ. පඤ්ච දුශ්චරිතයෙහි යෙදෙන අමනුෂ්‍යන් පිළිබඳ තොරතුරු දක්වෙන එහි "**ගච්ඡන්තං වා අනුගච්ඡෙය්‍ය ඨිතං වා උපතිට්ඨෙය්‍ය නිසින්නං වා උපනිසීදෙය්‍ය නිපන්නං වා උපනිපජ්ජෙය්‍ය**" යනුවෙන් මිනිස් චර්යා සමඟ අනුගත වෙමින් කටයුතු කරන බව දක්වා ඇත. **සංයුත්තනිකායයේ සක්ක සංයුත්තය** හා **යක්ඛ සංයුත්තය** ද නිදර්ශන සහිත ප්‍රමාණවත් මූලාශ්‍රය වේ. **පේතවත්ථුපාළියට** අනුව සෙම, සොටු, මළ මූත්‍රා ආඝ්‍රාණය හා අනුභව කරන අමනුෂ්‍යයන් සේ ම මිනිසුන් තුළ පහළ වන රාගය, ද්වේෂය වැනි මනෝභාවයන් ආහාරය කොටගත් අමනුෂ්‍යයන් පිළිබඳව ද දක්වා ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ එබඳු අමනුෂ්‍ය කොටස් සමඟ ගනුදෙනු කිරීම සම්බන්ධ බෞද්ධ නිර්දේශය හා එහි වර්තමාන භාවිතය කෙසේ විය යුතු ද යන්න පිළිබඳ විමසා බැලීමකි. වණිජකරණයට හසු වී ඇති පාරම්පරික ඥාන සමුදායයක් සහිත ගුප්ත ශාස්ත්‍රය නිසා සිදුවන සමාජ අපචාරවලින් මිදී ධර්ම මාර්ගයකින් ඊට පිළියම් සෙවීම උසස් සමාජ ප්‍රතිලාභ අත්කර දෙනු ඇත.

**ප්‍රමුඛ පද :** අමනුෂ්‍ය බලපෑම්, ගුප්ත ශාස්ත්‍රය, ප්‍රතිකර්ම, මනෝ රෝග